**තනතුරු පුරප්පාඩු**
**ආරක්ෂක අමාත්‍යාංශය**

**ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් කාර්යාල කාර්ය සහයක තනතුර (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම.**

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් කාර්යාල කාර්ය සහයක තනතුර සඳහා ස්ථිර පදනම මත පුරප්පාඩු 01ක් පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. බඳවා ගැනීමේ ක්‍රමය:

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධරයා විසින් පත් කැරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමෙන් පසු III ශ්‍රේණියට බඳවාගනු ලැබේ

i. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම්/ බඳවා ගැනීම් මෙන්ම සේවා ගණය තුළ උසස් කිරීම් ද මෙම පටිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන පරිදි පමණක් සිදු කළ යුතුය.

ii. බඳවා ගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට ආනුෂාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

iii. මෙම බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් මෙහි දැක්වෙන විධි විධාන ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක විය යුතුය.

පත්වීම් බලධාරයා වනුයේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවයි.

## 02. අවශ්‍ය සුදුසුකම් :

i. සුදුසුකම්

- **බාහිර අයදුම්කරුවන් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම.

ii. කායික සුදුසුකම්:

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. වෙනත් සුදුසුකම් :

( අ ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
( ආ ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථීරය

ii. සේවයේ/ තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලබන සේවකයකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

**04. වයස් සීමාව :**

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු : 18ට නොඅඩු හා අවු : 45ට නොවැඩි විය යුතුය.

**05. වැටුප් පරිමාණය :**

PL 1 2025 - රු 40,500 - 10x 450 – 10 x 490 - 7 x 540 – 15 x 590 – 62,530

(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උපලේඛනය පරිදි වේ.)

**06. යෝග්‍යතා ඇගයීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| **01.** අදාළ පළපුරුද්ද | ලකුණු | **20** |
| **02.** අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | ලකුණු | **20** |
| **03.** සම්මුඛ පරීක්ෂණයේදි දක්වන කුසලතාව | ලකුණු | **60** |
| මුළු ලකුණු ගණන | | **100** |

**සටහන -** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවනි සහතිකපත්‍ර වලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරිම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**08.** **අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක සේවා අංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනය වෙත **2026.03.27** දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් 02 වන පිටුව අංක 04 සිට 07 දක්වාත් ඇතුලත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ **කාර්යාල කාර්ය සහයක තනතුර** "තනතුර (ස්ථිර) යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතීඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරීයකු හෝ රු. 72,280/- ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරීයකු විසින් සහතික කළ යුතුය.

v. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09.** **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**11**. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධාරයා වන ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවේ නියමය පරිදි,

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.
2026 පෙබරවාරි මස 27 දින